රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Provincial Councils and Local Government**

| පළාත් සභා සහ පළාත් පාලන අංශය | மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரிவு | Provincial Councils and Local Government Division |
|---|---|---|
| 330, යූනියන් පෙදෙස, කොළඹ 02. | 330, யூனியன் பிளேஸ், கொழும்பு 02. | 330, Union Place, Colombo 02. |

දුරකථන / தொலைபேசி / Telephone: 011-2305326
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2329725
ඊ-මේල් / மின்னஞ்சல் / Email: secretary@pclg.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: https://mpclg.gov.lk/


මගේ අංකය / எனது இல / My No: PL/8/4/2-Data Analytic Cell (Vol III)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.11. 14

ප්‍රධාන ලේකම්,
බස්නාහිර/ දකුණ/ මධ්‍යම/ උතුර/ නැගෙනහිර/ ඌව/ උතුරුමැද/ වයඹ/ සබරගමුව පළාත් සභාව

**පළාත් පාලන ආයතන කළමනාකරණ දත්ත පද්ධතිය (LoGo MIS) විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා මාර්ගෝපදේශය**

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ප්‍රාදේශීය මට්ටමින් මහජන සේවාවන් සැපයීමේ කේන්ද්‍රීය අංශයකි. පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ සංවර්ධනාත්මක තීරණ ගැනීමේ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය පළාත් පාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (Local Government Management Information System – LoGoMIS) හඳුන්වා දී ඇත. මෙම මාර්ගෝපදේශය මගින් පළාත් පාලන ආයතන, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල, පළාත් පාලන කොමසාරිස් කාර්යාල, පළාත් අමාත්‍යාංශ, පළාත් සභා සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ වගකීම විස්තර කෙරෙන අතර එමගින් දත්ත පද්ධතියට නිවැරදි, යාවත්කාලීන හා සම්පූර්ණ දත්ත ඇතුලත් කිරීම අපේක්ෂා කෙරේ. LoGoMIS ඵලදායී ලෙස භාවිතා කිරීම මගින් සියලුම පළාත් පාලන, උප ජාතික සහ ජාතික මට්ටම්වල උපායමාර්ගික සැලසුම්කරණය සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීමට සහාය වන මධ්‍යගත සහ තත්කාලීන දත්ත වේදිකාවක් නිර්මාණය වනු ඇත.

## 2. අරමුණ

පළාත් පාලන ක්ෂේත්‍රයේ සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම උදෙසා සකස් කරන ලද LoGoMIS තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියට සෘජුවම සම්බන්ධවන ජාතික, පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටම්වල ඒ ඒ නිලධාරීන්ගේ කාර්යභාරය හා දායකත්වය පිලිබඳ අවබෝධයක් හා මග පෙන්වීමක් ලබා දීම තුළින් නිවැරදි හා යාවත්කාලීන වූ තොරතුරු කළමනාකරණ පද්ධතියක් ලෙස LoGoMIS විධිමත්ව පවත්වා ගෙන යාම සහ 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය පනතෙහි XIII වන කොටස යටතේ දක්වා ඇති පරිදි පළාත් පාලන ආයතනවල අයවැය දත්ත මෙම අමාත්‍යාංශය වෙත ලබා ගත හැකිවන පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම මෙම මාර්ගෝපදේශයේ අරමුණ වේ .

## 3. නියමිත වේලාවට සහ නිවැරදි දත්ත ඇතුළත් කිරීමේ වැදගත්කම

දත්ත හා තොරතුරු මත පදනම්ව තීරණ ගැනීමේදී, නියම කලට නිවැරදි දත්ත ඇතුළත් කර තිබීම ඉතා වැදගත් වේ. ඒ අනුව, තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂමව සම්පත් වෙන් කිරීම තුළින් පළාත් පාලන ආයතනවල සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා අවකාශය සැලසේ.

- තීරණ ගැනීම සඳහා තත් කාලීන දත්ත:
    - නිසි කලට දත්ත ඇතුළත් කිරීම තුළින් පළාත් පාලන ආයතනවල සැලසුම් සකස් කිරීම, අයවැයකරණය සහ අනෙකුත් තීරණාත්මක පරිපාලන කාර්යයන් සඳහා යාවත්කාලීන තොරතුරු ඇති බව සහතික කෙරේ.
- විනිවිදභාවය සහ වගවීම:
    - නිවැරදි හා යාවත්කාලීන දත්ත පද්ධතියක් පැවතීම පළාත් පාලනයේ විනිවිදභාවය සහ වගවීම ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට මග සලසයි.
- කාර්යක්ෂමව සම්පත් වෙන් කිරීම:
    - නිවැරදි දත්ත පවත්වා ගැනීම මගින් සම්පත් වෙන් කිරීම සහ ප්‍රජාවේ අවශ්‍යතා කාර්යක්ෂමව සපුරාලීම සඳහා වඩා හොඳ තීරණ ගැනීමට හැකියාව ලැබේ.

## 4. ප්‍රධාන පාර්ශවකරුවන්ගේ භූමිකාවන් සහ වගකීම්

සියලුම පළාත් පාලන ආයතන මට්ටමින් සහ පළාත් සභා මට්ටමින්, පහත සඳහන් ආයතන විසින් මෙම මාර්ගෝපදේශ අනුගමනය කරමින් LoGoMIS දත්ත පද්ධතිය විධිමත්ව පවත්වා ගෙන යාමත්, එම දත්ත විශ්ලේෂණය තුළින් ඉදිරි සංවර්ධන තීරණ ගැනීමත්, මෙම දත්ත පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය වෙත යෝජනා ඉදිරිපත් කිරීමත් ප්‍රධාන පාර්ශවකරුවන්ගෙන් අපේක්ෂා කෙරේ. ඒ සඳහා වන පරිශීලක අත්පොත "ඇමුණුම 1" වශයෙන් මේ සමඟ ඉදිරිපත් කර ඇත. මෙම අමාත්‍යාංශයේ www.pclg.gov.lk වෙබ් අඩවියට පිවිස මෙය භාගත කර ගත හැකිය.

ඒ අනුව, පහත දැක්වෙන ඒ ඒ ආයතන මට්ටම්වල දී අදාළ මාර්ගෝපදේශ අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

### 4.1 පළාත් පාලන ආයතන

i. පරිපාලන හා මූල්‍ය අංශ ආවරණය කරමින් ආයතනය තුළ දත්ත රැස් කිරීමේ සහ ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය සඳහා සුදුසු නිලධාරීන් දෙදෙනෙකු හඳුනාගෙන අදාළ කාර්යභාරයන් පැවරීම පළාත් පාලන ආයතනයේ ලේකම්/කොමසාරිස් ගේ වගකීමකි. හඳුනාගත් නිලධාරීන් විශ්‍රාම යාමේ දී, ස්ථාන මාරුවීමේ දී, දිගු කාලයකට නිවාඩු ලබන අවස්ථාවල දී මෙම කාර්යය ඉටුකිරීමට වෙනත් නිලධාරීන්ට අදාළ වගකීම් පැවරිය යුතුය.

ii. පළාත් පාලන ආයතනයට අදාළ පොදු/සාමාන්‍ය, කාර්යමණ්ඩල, වාහන, ග්‍රාම නිලධාරී වසම්, කොට්ඨාස හා වාර්ෂික අයවැය සම්බන්ධ තොරතුරු සෑම වසරකම ජනවාරි 31 වන දිනට ප්‍රථම පද්ධතියට ඇතුළත් කල යුතු අතර සුදුසු පරිදි යාවත්කාලීන කිරීම් සිදු කල යුතුය. මාසික සත්‍ය අදායම හා වියදම පිළිබඳ තොරතුරු අදාළ මාසයට පසු මාසයේ 10 වන දිනට පෙර පද්ධතියට ඇතුලත් කල යුතුය.

iii. දෝෂ සහිත දත්ත සමස්ත තීරණ ගැනීමේ ක්‍රියාවලියටම අහිතකර ලෙස බලපාන බැවින් ඇතුළත් කරන දත්තවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පළාත් පාලන ආයතනයේ ලේකම්/කොමසාරිස් විසින් අදාළ ප්‍රවේශ නාමය (User Name) හා මුර පදය (Pass Word) ඔස්සේ LoGo MIS වෙත පිවිස අදාළ සත්‍යාපනය කිරීම සෑම මසකම 15 වනදාට පෙර සිදු කල යුතු වේ.

iv. LoGoMIS පද්ධතිය තුළ නව යාවත්කාලීන කිරීම් හෝ ක්‍රියාකාරීත්වයන් අවබෝධ කර ගැනීම සඳහාවන ධාරිතා සංවර්ධන වැඩසටහන් වලට සහභාගී විය යුතුය.

v. LoGoMIS පද්ධතිය වැඩිදියුණු කිරීම, අධීක්ෂණය කිරීම සඳහා වරින් වර සංවිධානය කරනු ලබන රැස්වීම් සහ වැඩමුළුවලට සහභාගී විය යුතුය.

vi. LoGoMIS හි දත්ත මඟින් පළාත් පාලන ආයතනයට අවශ්‍ය කරන කාර්ය සාධන වාර්තා, මූල්‍ය වාර්තා, අනුකූලතා වාර්තා, සම්පත් උපයෝගිතා වාර්තා, අනාගත සැලසුම්කරණය සහ වැඩිදුර අධ්‍යයනයන් සඳහා අදාළ වාර්තා සෑදීමට කාර්ය මණ්ඩලයට අවශ්‍ය උපදෙස් ලබා දී ඒ පිළිබඳව මනා අධීක්ෂණයක් පවත්වා ගත යුතුය.

vii. මෙම අමාත්‍යාංශයේ වියදම් විමංසන අංශය විසින් සකසනු ලබන පළාත් පාලන ආයතනයන්හී අර්ධ වාර්ෂික හා වාර්ෂික මූල්‍ය කාර්යසාධන වාර්තා සැකසීම සඳහා අවශ්‍ය කරන දත්ත ලබා දීමට මෙම දත්ත පද්ධතිය උපයෝගී කර ගත යුතුය.

### 4.1.1 පළාත් පාලන සහකාර කොමසාරිස් (ACLG) කාර්යාලය

i. LoGoMIS පද්ධතියට අදාළව පළාත් පාලන ආයතනවල වගකීම පැවරී ඇති නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම සහ ඔවුනට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ACLG කාර්යාලයේ සුදුසු නිලධාරීන් දෙදෙනෙකු වෙත වගකීම් පැවරීම.

ii. පළාත් පාලන ආයතනය විසින් නිසි කලට නිවැරදි දත්ත ඇතුළත් කිරීමේ ප්‍රගතිය මාසිකව අඛණ්ඩව අධීක්ෂණය කළ යුතුය.

iii. දත්ත ඇතුළත් කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම හා ගැටළු විසඳීම සඳහා පළාත් පාලන ආයතන සමඟ අඛණ්ඩ සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය.

iv. දත්ත ඇතුළත් කිරීමේ දී පළාත් පාලන ආයතන මට්ටමට අවශ්‍ය වන තාක්ෂණික සහාය ලබාදිය යුතුය.

v. ඔබ වෙත ලබා දී ඇති ප්‍රවේශ නාමය (User Name) හා මුර පදය (Pass Word) මඟින් LoGoMIS වෙත පිවිස පළාත් පාලන ආයතන විසින් පද්ධතියට ඇතුළත් කර ඇති දත්ත නිවැරදි සහ යාවත්කාලීන බවට සත්‍යාපනය සෑම මසකම 20 වනදාට පෙර කළ යුතුය.

vi. ධාරිතා සංවර්ධන වැඩසටහන් වලට සහභාගී වීම තුළින්, LoGoMIS පද්ධතිය තුළ නව යාවත්කාලීන කිරීම් හෝ ක්‍රියාකාරීත්වයන් අධ්‍යයනය කර ගැනීම හා එම දැනුම අදාළ නිලධාරීන් වෙත සම්ප්‍රේෂණය කිරීම කළ යුතුය.

vii. පළාත් පාලන ආයතනවල කටයුතු පිළිබඳව දිස්ත්‍රික් මට්ටමෙන් පැවැත්වෙන රැස්වීම්වල දී LoGoMIS අධීක්ෂණය කිරීමට ද අවස්ථාවක් සලසා ගැනීම යෝග්‍ය වේ.

viii. LoGoMIS මඟින් කාර්ය සාධන වාර්තා, මූල්‍ය වාර්තා, අනුකූලතා වාර්තා, සම්පත් උපයෝගිතා වාර්තා ආදී සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට අවශ්‍ය විවිධ වාර්තා සකස් කර ගැනීම හා අනාගත සැලසුම්කරණය සහ වැඩිදුර අධ්‍යයනයන් සඳහා අදාළ වාර්තා සකස් කර ගැනීම කළ යුතු වේ.

ix. දිස්ත්‍රික්කයට අදාළ ඒ ඒ පළාත් පාලන ආයතන මට්ටමේ හා ACLG කාර්යාලයේ LoGoMIS පිළිබඳ වගකීම දරන නිලධාරීන්ගේ සන්නිවේදන තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ.

**4.1.2 පළාත් පාලන කොමසාරිස් (CLG) කාර්යාලය**

i. පළාත් පාලන ආයතනවල LoGoMIS පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේ වගකීම පැවරී ඇති නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම සහ ඔවුනට අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැලසීම සඳහා CLG කාර්යාලයේ සුදුසු නිලධාරීන් දෙදෙනෙකුට වගකීම් පැවරීම කළ යුතුය. (මාණ්ඩලික නිලධාරියෙකු ඇතුළුව)

ii. පළාත් පාලන ආයතන විසින් දත්ත ඇතුළත් කිරීම පිළිබඳව නිසි අධීක්ෂණයක් පවත්වා ගත යුතුය.

iii. යාවත්කාලීන වූ දත්ත ඇතුළත් වී තිබේද යන්න පිලිබඳව සෑහීමකට පත්විය යුතුය.

iv. LoGoMIS පද්ධතිය ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා පළාත් පාලන ආයතනවල අදාළ නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව සහ තාක්ෂණික සහාය ලබාදීමට කටයුතු කළ යුතුය.

v. LoGoMIS පද්ධතිය තුළ නව යාවත්කාලීන කිරීම් හෝ ක්‍රියාකාරීත්වයන් සම්බන්ධයෙන් විටින් විට පැවැත්වෙන ධාරිතා සංවර්ධන වැඩසටහන් වලට සහභාගී විය යුතුය.

vi. පළාත් පාලන ආයතනවල කටයුතු පිළිබඳව දිස්ත්‍රික් හා පළාත් මට්ටමෙන් පැවැත්වෙන රැස්වීම්වල දී LoGoMIS අධීක්ෂණය කිරීමට ද අවස්ථාවක් සලසා ගැනීම යෝග්‍ය වේ.

vii. LoGoMIS මගින් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට අවශ්‍ය කාර්ය සාධන වාර්තා, මූල්‍ය වාර්තා, අනුකූලතා වාර්තා, සම්පත් උපයෝගිතා වාර්තා, අනාගත සැලසුම්කරණය සහ වැඩිදුර අධ්‍යයනයන් සඳහා අදාළ දත්ත උපයෝගී කර ගත යුතු වේ.

viii. LoGoMIS වෙත පිවිස පළාත් පාලන ආයතන විසින් දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති දත්ත නිවැරදි බවට සෑම මසකම 25 වනදාට පෙර සත්‍යාපනය කළ යුතුය.

ix. පළාතට අදාල ඒ ඒ පළාත් පාලන ආයතන මට්ටමේ, ACLG කාර්යාල මට්ටමේ හා CLG කාර්යාල මට්ටමේ LoGoMIS පිළිබඳ වගකීම දරන නිලධාරීන්ගේ සන්නිවේදන තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ.

**4.1.3 ප්‍රධාන ලේකම්, අදාළ පළාත් අමාත්‍යාංශයේ ලේකම් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්**

i. පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන ආයතන දත්ත ඇතුලත් කිරීම සහ කළමනාකරණය සඳහා වන උක්ත මාර්ගෝපදේශ පිළිපැදීම පිළිබඳව පළාත් මට්ටමින් LoGoMIS ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

ii. දත්ත රැස් කිරීම, දත්ත පද්ධතියට ඇතුලත් කිරීම සහ සත්‍යාපනය කිරීම නිසි පරිදි සිදුවේද යන්න අධීක්ෂණය කිරීම.

iii. පළාත් පාලන ආයතන විසින් ඇතුළත් කරන ලද දත්තවල නිරවද්‍යතාවය සහ භාවිතය පිළිබඳව පළාත් මට්ටමේ විවිධ රැස්වීම් වලදී අවධානයට ලක් කිරීම.

iv. LoGoMIS වෙතින් අදාළ වාර්තා ජනනය කර උපායමාර්ගික සැලසුම්කරණය සහ වැඩිදුර අධ්‍යයනයන් සඳහා එම දත්ත භාවිතා කිරීමට නිලධාරීන් උනන්දු කිරීම.

v. පළාත් සහ පළාත් පාලන මට්ටම්වල කාර්ය මණ්ඩලයට දත්ත ඇතුළත් කිරීම, දත්ත විශ්ලේෂණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලින් ඇතුළුව LoGoMIS ක්‍රියාකාරීත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

vi. ප්‍රාදේශීය මට්ටමින් සේවා සැපයීම, පරිපාලන කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් LoGoMIS මගින් සැලසෙන දායකත්වය ඇගයීම.

vii. LoGoMIS දත්ත පද්ධතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රතිපෝෂණ ලබා දී වැඩිදියුණු කිරීම හා වෙනස් කිරීම පිළිබඳ යෝජනා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම

**4.2 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

i. LoGoMIS සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ උපායමාර්ගික රාමුව සංවර්ධනය කිරීම තුළින් පළාත් පාලන හා පළාත් සභා මට්ටමින් රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය දායකත්වය සපයනු ලබයි.

ii. LoGoMIS හි දත්ත සහ තොරතුරු අවශ්‍ය වන ප්‍රාදේශීය උප ජාතික හා ජාතික මට්ටමේ පාර්ශවයන් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනු ලබයි.

iii. LogoMIS දත්ත පද්ධතිය මැනවින් පවත්වා ගෙනයාම සඳහා කටයුතු කරනු ලබයි.

iv. පළාත් පාලන මට්ටමේ හා පළාත් මට්ටමේ නිලධාරීන් සඳහා අමාත්‍යාංශය පුහුණු වැඩසටහන් සංවිධානය කර සම්බන්ධීකරණය කරනු ලබයි. දත්ත ඇතුළත් කිරීම, දත්ත විශ්ලේෂණය සහ වාර්තා සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු මෙයට ඇතුළත් වේ.

v. LoGoMIS ක්‍රමානුකූලව ක්‍රියාත්මකවීම පිළිබඳව පළාත් පාලන ආයතන හා පළාත් සභා සමඟ ඒකාබද්ධව අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරනු ලබයි.

vi. LoGoMIS මෘදුකාංගය පිළිබඳ ඉදිරි සංවර්ධන හා නඩත්තු කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබයි.

LoGoMIS හි සාර්ථකත්වය රඳා පවතින්නේ සියලුම පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ සම්බන්ධීකරණය තුළ ය. මෙම මාර්ගෝපදේශයට අනුකූල වීමෙන් දත්ත නිරන්තරයෙන් නිවැරදි, යාවත්කාලීන වන බව සහතික කරන අතර එමගින් ඵලදායී පාලනය, වැඩිදියුණු කළ සේවා සැපයීම සහ ප්‍රශස්ත සම්පත් වෙන් කිරීම සක්‍රිය කරයි. ශ්‍රී ලංකාව පුරා පළාත් පාලන පරිපාලනය ශක්තිමත් කරමින් කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීම

සඳහා පළාත් පාලන, පළාත් සභා හා මධ්‍යම රජය යන ත්‍රිවිධ මට්ටමට LoGoMIS අත්‍යවශ්‍ය මෙවලමක් වනු ඇත. ඒ අනුව, ප්‍රජා සංවර්ධනය සහ රාජ්‍ය සේවා විශිෂ්ටත්වය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් LoGoMIS තුළ වලංගු නිවැරදි දත්ත ලබා ගැනීම සහතික කිරීමට ප්‍රශස්ත උත්සාහයක් ගන්නා ලෙස ඔබෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

තවද, මෙම මාර්ගෝපදේශය සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරවරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, පළාත් පාලන කොමසාරිස්වරුන් සහ සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් සහ පළාතේ සියලුම පළාත් පාලන ආයතන දැනුම්වත් කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

LoGoMIS කළමනාකරණය කරනු ලබන්නේ මෙම අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන අංශයේ ක්‍රමසම්පාදන අංශය විසින් වන බැවින් තව දුරටත් අත්‍යවශ්‍ය වන දැනුම්වත් වීම්, ප්‍රතිපෝෂණ හා අදාළ වෙනත් විමසුම් සඳහා planning.div@pclg.gov.lk හා 0112302746/ 0112302536 ඔස්සේ එම අංශය හා සම්බන්ධ විය හැකිය.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම්, මුදල් කොමිෂන් සභාව
2. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය/ පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශය, - කරු.දැ.ගැ.ස
   සියළුම පළාත් සභා - කරු.දැ.ගැ.ස
3. අතිරේක ලේකම්/ප්‍රධාන මූල්‍ය නිලධාරී, පළාත් සභා හා
   පළාත් පාලන අංශය
4. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, සියළුම පළාත් සභා - කරු.දැ.ගැ.ස
5. පළාත් පාලන කොමසාරිස්, සියළුම පළාත් සභා - කරු.දැ.ගැ.ස
6. සහකාර පළාත් පාලන කොමසාරිස්, සියළුම පළාත් සභා - කරු. අ.ක.ස
7. ලේකම්/නාගරික කොමසාරිස්, සියලුම පළාත් පාලන ආයතන - කරු. අ.ක.ස

- කරු. අ.ක.ස